සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

**තෙවන වාර පරීක්ෂණය 2017** — **11 ශ්‍රේණිය**
**மூன்றாம் தவணைப் பரீட்சை 2017** — **தரம் 11**
**Third Team Test 2017** — **Grade 11**

**බුද්ධ ධර්මය I**
**Buddhist I**

**පැය එකයි**
**One hours**

**නම/විභාග අංකය : ....................................................................**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

1. "සරසවි සඳරැස" පුවත්පත ආරම්භ කරන ලද්දේ,
   1. සිල්වත් සමාගම පිහිටුවීමෙන් පසුවය
   2. මහාබෝධි සමාගම පිහිටුවීමෙන් පසුවය
   3. පරම විඥානාර්ථ සමාගම පිහිටුවීමෙන් පසුවය
   4. ධර්මපාල පදනම පිහිටුවීමෙන් පසුවය

2. "අභිධර්ම මාර්ගය" ග්‍රන්ථයේ කතුවරයා වන්නේ,
   1. රේරුකානේ චන්ද්‍රවිමල හිමිය
   2. ධර්මසේන හිමිය
   3. බුද්ධ පුත්‍ර හිමිය
   4. ධර්මකීර්ති හිමිය

3. සමථ භාවනාව වැඩීමේදී උදව් වන කමටහන් 40 අතරට අයත් නොවන්නේ,
   1. දස කසිණය
   2. දස අසුභය
   3. දස අනුස්සතිය
   4. දස මාර සේනාවය

4. සාමඤ්ඤඵල සූත්‍රයට අනුව වනයෙහි අතරමං වූවකුට උපමා කර ඇත්තේ,
   1. ව්‍යාපාදය ඇති පුද්ගලයාය
   2. විචිකිච්ඡාව ඇති පුද්ගලයාය
   3. ථිනමිද්ධ ඇති පුද්ගලයාය
   4. කාමච්ඡන්ද ඇති පුද්ගලයාය

5. උපේක්ෂා පාරමිතාව පිරූ ආකාරය පැහැදිලි කිරීමට උදාහරණ වන්නේ,
   1. ලෝමහංස ජාතකයයි
   2. මහාකපි ජාතකයයි
   3. තේමිය ජාතකයයි
   4. වටට්ක ජාතකයයි

6. "නික්කම ධාතු" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

1. රහත් ධාතූන් වහන්සේලා පිළිබඳවය
2. කේස ධාතු පිළිබඳවය
3. ඉදිරිපත් කිරීමේදී ඇතිකරගතයුතු වීර්ය පිළිබඳවයි
4. නිතර වීමේදී ඇතිකරගතයුතු වීර්ය පිළිබඳවයි

7. පාරමිතාවන් පිරීමේදී එම ගුණ ධර්ම පුහුණු කරන්නන් කරුණු පහකින් යුක්ත විය යුතුය. එහිදී අත්හළ යුතු කරුණුවලට අයත් වන්නේ,

1. ක්‍රෝධයෙන් තොරවීමයි
2. මානයෙන් තොරවීමයි
3. ඊර්ෂයාවෙන් තොරවීමයි
4. වෛරයකින් තොරවීමයි

8. "අංගුලිමාල" නම් තරුණයා රහත් උතුමකු බවට පත්වන්නේ බුදුරදුන් තුළ පැවති කුමන ගුණාංගය නිසාද?

1. තාදී ගුණය
2. අසරණ සරණ ගුණය
3. යථාවාදී තථාකාරී ගුණය
4. පුරිසදම්ම සාරථී ගුණය

9. බුද්ධත්වය ලබාගැනිම සඳහා බෝසතාණන් වහන්සේට පරාජය කිරීමට සිදුවූයේ,

1. තණ්හා, රති, රගා යන මාර දූවරුය
2. දසමාර සේනාවය
3. පස්වග තවුසන්ය
4. ඡන්න ඇමතියාය

10. බුදුරජාණන් වහන්සේ සත්ත බොජ්ඣංගය දේශනා කළේ,

1. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ රෝගී වූ විටය
2. පුතිගතතිස්ස තෙරුන් රෝගී වූ විටය
3. සැරියුත් මහ තෙරුන් රෝගී වූ විටය
4. අනුරුද්ධ තෙරුන් රෝගී වූ විටය

11. චුල්ලකම්ම විභංග සූත්‍රයට අනුව අප විසින් කරනු ලබන ක්‍රියාවන්ට අනුරූප ප්‍රතිඵල ලැබෙන බව දැක්වේ ඒ අනුව බොහෝ ආබාධ සහිතව උපදින්නේ,

1. ප්‍රාණඝාතය කරන නිසාය
2. ද්වේශයෙන් කටයුතු කරන නිසාය
3. සත්ව හිංසාව සිදු කරන නිසාය
4. අන් සැපතට ඊර්ෂ්‍යා කරන නිසාය

12. සිතීමේ හා විමසීමේ නිදහස පැහැදිලි කරන සූත්‍ර දේශනාව බුදුරදුන් විසින් දේශනා කරනු ලැබුවේ.

1. වජ්ජීන් උදෙසාය
2. කාලාමයන් උදෙසාය
3. ශාක්‍යයන් උදෙසාය
4. කෝලියන් උදෙසාය

13. පුද්ගලයෙකුගේ දියුණුවට හේතුවන කරුණු ලෙස මහා මංගල සූත්‍රයේදී දේශනා කළ කරුණු 38 අතරට අයත් වන කරුණක් වන්නේ,

1. ඍජු බවයි
2. පහසුවෙන් පෝෂණය කළ හැකි බවයි
3. වැඩ කටයුතුවල අල්ප බවයි
4. අටලෝදහමින් කම්පා නොවීම

14. අවිචාරයෙන් අන්තික්කා කන්නෙකුට උපමා කර දක්වා ඇත්තේ,

1. අඩු ආදායමක් ඇති වැඩියෙන් වියදම් කරන්නාය.
2. වැඩි ආදායමක් ඇති අඩුවෙන් වියදම් කරන්නාය
3. ආදායමට සමානව වියදම් කරන්නාය
4. කිසිවක් වියදම් නොකරන්නාය

15. ලෝවැඩ සඟරාව රචනා කරන ලද්දේ,

1. තොටගමුවේ රාහුල හිමිය
2. වීදාගම හිමිය
3. බුද්ධපුත්‍ර හිමිය
4. ධර්මසේන හිමිය

16. බෞද්ධයෙකුට ඉතා වැදගත් අංගයක් ලෙස සීලය හැඳින්විය හැක. ඒ අනුව සීලය අයත් නොවන ධර්ම කරුණු වන්නේ,

1. දස පින් කිරියාවත් වලටය
2. සප්ත ආර්ය ධනයන්ටය
3. සප්ත අපරිහානීය ධර්මයන්ටය
4. දසරාජ ධර්මවලටය

17. සීලය යනු කය වචනය දෙකේ සංවරයයි. එයින් කායික සීලයට අයත් වන්නේ,

1. කාමමිත්‍යාචාරයයි
2. පිසුනාවාචයයි
3. අභිධ්‍යාවයි
4. ව්‍යාපාදයයි

18. "පිරිසිදුකම හා අපිරිසිදුකම පවතින්නේ තමා කෙරෙහිය" යන අර්ථය ඇතුළත් ධම්මපද ගාථාව වන්නේ,

1. නතං කම්මං කතං සාධු ............ යන්නය
2. අක්කොච්ජිමං අවධිමං .......... යන්නය
3. සුකරානි අසාධුනි ............. යන්නය
4. අත්තනාව කතං පාපං ........ යන්නය

19. දෙවන පෑතිස් රජ සමයේ මහමෙවුනා උයනේ ඉදිකරන ලද මහා විහාරයට අයත් ස්ථානයක් වන්නේ,

1. වෙස්සගිරි විහාරයයි
2. ගල් විහාරයයි
3. තංගුත්ත පිරිවෙනයි
4. මයුරපාද පිරිවෙනයි

20. බුදු දහම මෙරටට ලැබුණු මුල් අවධියේදී ත්‍රිපිටකය සඳහා සිංහලෙන් අටුවා සම්පාදනය කර ඇත එම අටුවා හැඳින් වූ නමක් වන්නේ,

1. පැරණි අටුවා යන්නය
2. හෙළ අටුවා යන්නය
3. පාලි අටුවා යන්නය
4. ජාතික අටුවා යන්නය

21. බුදු දහම ආරක්‍ෂා කර ගැනීම සඳහා සංගායනා කිහිපයක් පවත්වා ඇති බව සහ ඉතිහාසයේ සඳහන් වේ. ඒ අතරින් තෙවන ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය ලෙස සැලකෙන්නේ,

1. විශාලා මහනුවර වාලුකාරාමයේය
2. සැවැත්නුවර ජේතවනාරාමයේය
3. රජගහනුවර වේළුවනාරාමයේය
4. පැළලුප් නුවර අශෝකාරාමයේය

22. මොග්ගලිපුත්ත තිස්ස මහ රහතන් වහන්සේ විසින් කථාවත්ථුප්පකරණය නම් ග්‍රන්ථය රචනා කිරීම

1. පළමු ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි
2. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිපලයකි
3. තෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි
4. සිව්වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයකි

23. භික්ෂූන් වහන්සේලාගේ නිරෝගිකම වෙනුවෙන් ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීම පරිදි බුදුරජාණන් වහන්සේ අනුමත කළ දෙයක් වන්නේ,

1. සක්මන් මළුවයි
2. පරිසරය පවිත්‍ර කිරීමයි
3. ගස් සිටුවීමයි
4. ජලය පානය කිරීමයි

24. ආහාරේ මත්තඤ්ඤුතා හෙවත් ආහාරයෙහි ප්‍රමාණය දැන අනුභව කිරීම නිසා ලැබෙන ප්‍රතිඵලයක් ලෙස භද්දාලි සූත්‍රයේ සඳහන් වන්නේ,

1. සුවපහසු පැවැත්මයි
2. පහසු පෝෂණයයි
3. ගස් සිටුවීමයි
4. ජලය පානය කිරීමයි

25. භික්ෂූන් වහන්සේලා ජලය පරිහරණය කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියාවක් ලෙස බුදුරදුන් දේශනා කර ඇත්තේ,

1. ජලය උණුකර නිවා ගැනීමයි
2. පෙරහන් කඩකින් ජලය පෙරා ගැනීමයි
3. ජලය සිසිල් කර පානය කිරීමයි
4. කිසිවක් නොකර පානය කිරීමයි

26. දිවා රෑ පිං වැඩෙන පිංකම් රාශියක් බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත. එම පිංකම් අතරට අයත් නොවන පිංකමක් වන්නේ,

1. මල් පලතුරු උයන් වැවීම
2. ස්වභාවික වනාන්තර වැවීම
3. ඒ දඬු පාලම් තැනීම
4. බලු කපුටු දාන පැවැත්වීම

27. ලෝකයේ පැවැත්ම හේතුඵල සම්බන්ධය මත සිදුවන බව පැහැදිලි කිරීමට උප්පාද, ඨිති, භංග යන අවස්ථාවන් යොදාගෙන ඇත. මෙහි උප්පාද යනු,

1. පැවතීමයි
2. නැතිවීමයි
3. ඇතිවීමයි
4. විනාශ වීමයි

28. කර්මය හා පුනර්භවය පිළිබඳ ඉගැන්වීම තුළින් අපගේ ජීවිතය ඇතුළු සියලු සත්වයන්ගේ ජීවිත,

1. යම් නියතියකට අනුව සිදුවන බව තේරුම්ගත හැක
2. කිසිදු අර්ථයක් නැති ජීවිත බවට තේරුම් ගත හැක
3. යම් මැවීමකට අනුව සිදුවන බව තේරුම් ගත හැක
4. මොලොවින් අවසන් නොවන බව තේරුම් ගත හැක

29. සුඛ, දුක්ඛ, උපේක්ඛා යනු,

1. ස්පර්සයේ අවස්ථා තුනකි
2. වේදනාවේ අවස්ථා තුනකි
3. තණ්හාවේ අවස්ථා තුනකි
4. උපාදානයේ අවස්ථා තුනකි

30. දිළින්දන්ට ධනෝපාය මාර්ග නොමැතිවීම නිසා බොහෝ සමාජ ප්‍රශ්න ඇතිවන අයුරු,

1. චක්කවත්ති සීහනාද සූත්‍රයේ දක්වා ඇත
2. සිඟාලෝවාද සූත්‍රයේ දක්වා ඇත
3. කාලාම සූත්‍රයේ දක්වා ඇත
4. චූල්ලකම්ම විභංග සූත්‍රයේ දක්වා ඇත

31. සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයන්හි වරදවා හැසිරීම යන ක්‍රියාවන්ගෙන් වැළකී සිටීම

1. සම්මා සංකල්පයයි
2. සම්මා වාචායි
3. සම්මා කම්මන්තයි
4. සම්මා ආජීවයි

32. රාජ්‍ය පාලනය යහපත්ව කිරීමට අදාළ ඉගැන්වීම් රැසක් බුදු දහමේ ඉගැන්වේ ඒ අතරට අයත් වන්නේ,

1. දස පාරමිතා
2. දස සංයෝජන
3. දස රාජ ධර්ම
4. දස මාර සේනාව

33. බෞද්ධයෙකු විසින් තම උත්සහයෙන් දෑතේ ශක්තියෙන් දහඩිය වගුරුවා දැහැමින් උපයාගන්නා ලද ධනය සතර ආකාරයකින් පරිභෝග කළයුතු බව දක්වමින් දේශනා කළ සූත්‍රය වන්නේ,

1. සච්චවිභංග සූත්‍රයයි
2. පත්තකම්ම සූත්‍රයයි
3. කාලාම සූත්‍රයයි
4. පරාභව සූත්‍රයයි

34. අනණ සූත්‍රයෙහි සඳහන් චතුර්විධ සැප අතර "භෝග සුඛ" ලෙස හඳුන්වන්නේ,

1. ධාර්මිකව උපයාගත් ධනයක් ඇතැයි යන සැපයයි
2. නිවැරදිව කාය, වාචී මනෝ කර්ම ඇතැයි යන සැපයයි
3. කිසිවෙකුට කිසිම ණයක් නැතැයි යන සැපයයි
4. ධනය පරිභෝග කිරීමෙන් ලබන සැපයයි

35. ගම්පොළ හා කෝට්ටේ යන යුගයන්හි රචනා වූ ග්‍රන්ථ දෙකක් පිළිවෙලින් සඳහන් වන වරණය වන්නේ,

1. සද්ධර්මාලංකාරය හා කාව්‍යශේඛරයයි
2. එළු අනන්තගලුවංශය හා සද්ධර්මාලංකාරයයි
3. කාව්‍යශේඛරය හා පඤ්චිකාපදීපයයි
4. ථූපවංශය හා බෝධි වංශයයි

36. බුදු පිළිම නෙලීමේදී හෙළ කලාකරුවන් විවිධ මුද්‍රා කර ඇත. බුදුරදුන් භාවනායෝගී සමාධි ගත ඉරියව්ව සංකේතවත් කරන මුද්‍රාව ලෙස සැලකෙනනේ,

1. ධර්ම චක්‍ර මුද්‍රාවයි
2. විතර්ක මුද්‍රාවයි
3. අභය මුද්‍රාවයි
4. ධ්‍යාන මුද්‍රාවයි

37. බුද්ධ ප්‍රතිමා ආරක්ෂාව සඳහා ඉදිකරසන ලද පිළිම ගෙවල් විශේෂයක් ලෙස ගෙඩිගේ හැඳින්වේ මෙසේ නිර්මාණය කළ ගෙඩිගේ අතරට අයත් වන්නේ,

1. රන්ගිරි දඹුලු විහාරයයි
2. තිංවක පිළිම ගෙයයි
3. රත්න ප්‍රාසාද ගොඩනැගිල්ලයි
4. කිරිබත් වෙහෙරයි

38. කැළණි විහාරයේ අලුත් විහාර මන්දිරයේ හා බොරැල්ලේ ගෝතමී විහාරයේ චිත්‍ර අඳින ලද ශිල්පීන් වන්නේ,

1. ඇල්බට් ධර්මසිරි හා ජෝර්ජ් කීට්ය.
2. සෝලියස් මෙන්දිස් හා සෝමබන්ධු විද්‍යාපති ය
3. සෝලියස් මෙන්දිස් හා ජෝර්ජ් කීට්ය
4. ඇල්බට් ධර්මසිරි හා සෝමබන්ධු විද්‍යාපති ය

39. ද්වේශය, වෛරය, ක්‍රෝධය, තරහව ඇති සිතුවිලි වලින් බැහැරව මෛත්‍රිය සහගත සිතුවිලිවලින් යුක්තව වාසය කිරීම

| | |
|---|---|
| 1. අව්‍යාපාද සංකප්පයයි | 2. අවිහිංසා සංකප්පයයි |
| 3. නෙක්ඛම්ම සංකප්පයයි | 4. මිජ්ජා සංකප්පයයි |

40. මහා මංගල සූත්‍රයේදී "අනවජ්ජානි කම්මානි" යනුවෙන් දේශනා කළ මංගල සූත්‍රය ලෙස සැලකෙන්නේ,

| | |
|---|---|
| 1. නිවැරදි රාජ්‍ය පාලනයයි | 2. නිවැරදි කර්ම කිරීමයි |
| 3. නිවැරදි ධන පරිබොජනයයි | 4. නිවැරදි රැකියාවක් කිරීමයි |

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

තෙවන වාර පරීක්ෂණය 2017 — 11 ශ්‍රේණිය
மூன்றாம் தவணைப் பரீட்சை 2017 — தரம் 11
**Third Team Test 2017** — **Grade 11**

බුද්ධ ධර්මය II
**Buddhist II**

පැය දෙකයි
**Two hours**

- **පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නය සඳහා 1 කොටසට 2 බැගින් ලකුණු 2x10 ලකුණු 20 ක් ද තෝරා ගත් ප්‍රශ්න 4ට පිළිතුරු සඳහා ලකුණු 10 බැගින් හිමිවේ.**

(01). i. "නිබද්ධ චාරිකා" චාරිකා නමින් හැඳින්වෙන්නේ කුමක්ද?

ii. "සමග්ග හෝථ මා විවද්ථ" යන්නෙහි අර්ථය ලියන්න.

iii. පංච නීවරනයන්ගෙන් දෙකක් නම් කරන්න

iv. වාග් සුචරිතය යනු කුමක්ද?

v. දීඝජානු කෝලිය පුත්‍රයාට දේශනා කළ මොලොව දියුණුවට හේතු වන කරුණු වලින් දෙකක් ලියන්න.

vi. බුද්ධ ප්‍රතිමා කලාවේ දක්නට ලැබෙන ආසන වලින් දෙකක් නම් කරන්න

vii. පටිච්චසමුප්පාද න්‍යායට අනුව වේදනා ඇතිවීමට හේතුව ලෙස දැක්වෙන්නේ කුමක්ද?

viii. බුදුරජාණන් වහන්සේ තෝදෙය්‍ය පුත්‍ර සුභ නම් තරුණයාට කර්මය හා එහි විපාක පිළිබඳව දේශනා කළ සූත්‍රය කුමක්ද?

ix. සිතීමේ හා විමසීමේ නිදහස පැහැදිලි කරන කාලාම සූත්‍රයෙහි අඩංගු කරුණු වලින් දෙක් ලියන්න.

x. "සමජීවිකතා" යනු කුමක්ද?

(02). i. බෝසතාණන් වහන්සේ බුද්ධත්වය ලබාගත් මුල් කාලයේදී මුහුණ දුන් අභියෝග දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

iii. අභියෝගවලට මුහුණ දීමට අප සැමට සිදුවේ. සිසුන් වශයෙන් අපට මුහුණදීමට සිදුවන අභියෝග ජයගන්නා ආකාරය බුද්ධ චරිතය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03). i. බුදු දහමේ සඳහන් වන ප්‍රධාන භාවනා ක්‍රම දෙක නම් කරන්න. (ලකුණු 02)

ii. තම චරිත ලක්ෂණවලට අනුව කමටහන් ලබාගැනීම කළයුතුය. එසේ කමටහන් ලබාගැනීමේදී සලකා බලන පුද්ගල චරිත කිහිපයකි. එන් තුනක් නම් කරන්න. (ලකුණු 03)

iii. දිනපතා භාවනා කිරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන ගැන විස්තර කරන්න. (ලකුණු 05)

(04). i. "යමක් කිරීමෙන් පසතැවෙන්නට සිදුවේද එබඳු දේ නොකිරීම යහපත්ය" මෙම අර්ථය සඳහන් ගාථාව ලියන්න. (ලකුණු 02)

ii. සීලයෙහි සඳහන් විරමණය හා සමාදානය යන්න හඳුන්වන්න. (ලකුණු 03)

iii. යහපත් ජීවිතයක් ගත කිරීමට ධම්ම පදයෙන් ලැබෙන මෙහෙය අපමණය. නිර්දේශිත ධම්මපද ගාථා ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05). i. දස රාජ ධර්මවලින් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. ඉන් එකක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

iii. පත්තකම්ම සූත්‍රයට අනුව ධනය පරිහරණය කළයුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06). i. දඹදෙණි යුගයේ හා කුරුණෑගල යුගයේ රචනා කළ ග්‍රන්ථ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. "ප්‍රතිමාඝර" යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03)

iii. මහින්දාගමනයෙන් පසුව අපට ලැබුණු දායාද පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

(07). පහත සඳහන් මාතෘකා ඇසුරින් දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. දෙවන ධර්ම සංගායනාව (ලකුණු 02)

ii. කර්මය හා පුනර්භවය (ලකුණු 03)

iii. රේරුකානේ චන්දවිමල නාහිමි (ලකුණු 05)

iv. පරිසරය (ලකුණු 05)